
# ශ්‍රී ලංකාවේ 1:50000 භූ ලක්ෂණ සිතියම්වල මූලික ලක්ෂණ





M.R.M. මාහර
කෑ/දෙහි/ මියනවිට ක.වි.
දැරණියගල


# භූ ලක්ෂණ සිතියමක ලක්ෂණ

- භූමියේ ස්වභාවිකව නිර්මාණය වූ ලක්ෂණ ද මිනිසාගේ මැදිහත්වීමෙන් නිර්මාණය වූ ලක්ෂණ ද මෙමඟින් නිරූපණය කෙරේ.
- මෙම ලක්ෂණ නිරූපණයට වර්ණ, අක්ෂර ,සංකේත හා අංක භාවිතා කර ඇත.
- පොළෝතලයේ විවිධ ලක්ෂණ මෙම සිතියම් මඟින් ඉදිරිපත් කළ හැකිය.

# භූමිය මත දකින ස්වභාවික ලක්ෂණ








# මිනිසාගේ මැදිහත් වීමෙන් නිර්මාණය කරන ලද ලක්ෂණ





ටෝකියෝ අසල අධිවේගී මාර්ග පද්ධතියේ හුවමාරුවක් (Highway Interchange)





# පහත දී ඇති ලක්ෂණ වගුව අනුව තෝරා ලියන්න

කඳුවැටි, මහා මාර්ග, ගොඩනැගිලි, ගංගා , වනාන්තර ,
වැව් , වගා බිම්, තැනිතලා , තණ බිම් , ඇළ මාර්ග

| ස්වභාවික ලක්ෂණ | මිනිසා නිර්මාණය කරන ලද ලක්ෂණ |
|---|---|
| | |
| | |
| | |
| | |

# 1:50000 භූ ලක්ෂණ සිතියමේ පරිමාණය සහ විශාලත්වය

- 1:50000 යනු මෙට්‍රික් සිතියමේ පරිමාණයයි.
- ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව 1980 දශකයේ මුල් භාගයේ මෙම සිතියම් සැකසීම ආරම්භ කරන ලදී.
- 1:50000 සිතියම මත එක ඒකකයක් = භූමිය මත ඒකක 50000

  *1* cm = *50000* cm *(1|2 කි.මී)*

**2cm = 1 km**

# 2cm = 1km

- භූමියේ 1 කි.මි. ප්‍රමාණයක් 1:50000 සිතියමේ 2 cm දක්වනු ලැබේ.

සැබෑ භූමියේ 1 කි.මි.ක් දුර මාර්ගයක් සිතියමේ දක්වන්නේ 2 cm කිනි.

# පිළිතුරු සපයන්න

1.සැබෑ භූමියේ දුර ප්‍රමාණයන් km වලින් දක්වන්න.

4cm

2cm

8cm

10cm

2. දුර ප්‍රමාණයන් cm වලින් දක්වන්න.

3km

6km

9km

# සිතියම් පත්‍ර


- ශ්‍රී ලංකාවේ උතුරේ සිට දකුණට දුර - 432km
- ශ්‍රී ලංකාවේ කොළඹ සිට සංගමන්කන්ද ට දුර - 224km


**1:50000 පරිමාණය අනුව සිතියම**

432km = 864cm(8.64m)

224km = 448cm(4.48m) ක් විශාල වේ.

මෙවැනි සිතියමක් පරිහරණය ප්‍රයෝගිකව අපහසු නිසා සමස්ත සිතියමම කොටස් 92කට බෙදා ඇත.


1:50,000
පත්‍ර සූචිය


BIBILE

# පිළිතුරු සපයන්න

- සිතියම නිරීක්ෂණය කර පහත අංක වලට අදාළ සිතියම් පත්‍රවල නම ලියා දක්වන්න.

  - 01
  - 02
  - 23
  - 61
  - 91
  - 92

01.ඔබේ පාසල පිහිටා තිබෙන සිතියම් පත්‍රයේ නම සහ අංකය ලියන්න.

02.එම සිතියම වටා තිබෙන සිතියම් පත්‍ර අංකය සමඟ නම් කරන්න.


03.සාගරය වැඩි ප්‍රමාණයක් අන්තර්ගතව ඇති සිතියම පත්‍ර 5ක් නම් කරන්න.

# භූ ලක්ෂණ සිතියම


භූ ලක්ෂණ සිතියම

| භෞතික ලක්ෂණ | සංස්කෘතික ලක්ෂණ |
|---|---|
| කඳුවැටිය | පරිපාලන මායිම් |
| නෙරුව | ප්‍රධාන මහාමාර්ග |
| නිම්නය | අධිවේගී මාර්ග |
| කොත්කන්ද | දුම්රිය මාර්ග |
| කපොල්ල | වැව් හා වාරිමාර්ග |

# 1:50000 භූ ලක්ෂණ සිතියම් කොටසක්.....




Scale : 1 : 50 000





7.9 රූපය

1:50 000 භූ ලක්ෂණ සිතියමක සම්මත සලකුණු දක්වන සටහන

# භෞතික ලක්ෂණ

## සමෝච්ච රේඛා




භූමිය උස්බිම්, තැනිතලා, නිම්න වැනි විවිධ භූ ලක්ෂණ වලින් යුතු වේ.

මෙම භූ ලක්ෂණ දැක්වීම සඳහා සමෝච්ච රේඛා භාවිතා කෙරේ.

සමෝච්ච රේඛා යනු සමාන උස ඇති ස්ථාන එකිනෙක සම්බන්ධ කරමින් ඇඳ ඇති රේඛාය.

සමෝච්ච රේඛාවකට නිශ්චිත වටිනාකමක් ඇත. අන්තරය සමාන වේ.


1:50,0000 භූ ලක්ෂණ සිතියමේ සමෝච්ච රේඛා අන්තරය මීටර 20 කි.

# කඳු වැටිය

- පටු දිගටි හැඩයෙන් විහිදෙන උස ප්‍රදේශ කඳු වැටියක් ලෙස හඳුන්වයි.

- මෙවැනි කඳු වැටියකට මුදුන් කීපයක් තිබිය හැකිය.





# කොත් කන්ද








Fig. 2.9. A Conical Hill

තැනිතලා බිමක කොතක හැඩයට විහිදුනු උස් බිමක් කොත් කන්දක් ලෙස හැදින්වේ.

වෘත්තාකාරව විහිදුනු සමෝච්ච රේඛා මඟින් සිතියමේ කොත් කන්ද නිරූපණය වේ.


# නෙරුව




උස් ප්‍රදේශයක සිට පහත් ප්‍රදේශයක් දෙසට නෙරා ඇති භූ ලක්ෂණය නෙරුව වේ.

උස් බිමේ සිට පහත් බිමකරා පටු දිගටි හැඩයට විහිදෙන සමෝච්ච රේඛා මඟින් සිතියමේ නෙරුව නිරූපණය කෙරේ.

# නිම්නය







උස් බිම් දෙකක් අතර පිහිටි පහත් බිම නිම්නයක් වේ. ඇතැම් නිම්න ඔස්සේ ගංගා ගලා බසී.

# කපොල්ල







උස් බිමක හෝ කඳු වැටියක මුදුන් අතර පිහිටි අඩු උසකින් යුතු විවරය කපොල්ල ලෙස හඳුන්වයි.


# සංස්කෘතික ලක්ෂණ

## පරිපාලන මායිම්





පරිපාලන මායිම් නිර්ණය කිරීමේදී ස්වභාවික ලක්ෂණ වන ගංගා , කඳුවැටිවල පිහිටීම බොහෝ දුරට යොදා ගනී.

# ප්‍රධාන මහාමාර්ග











ප්‍රධාන මහාමාර්ගය රතු වර්ණය දෙපස කළු වර්ණ රේඛා දෙකක් මඟින් දක්වා ඇත.

A ශ්‍රේණියේ මාර්ගය A අක්ෂරය සහ මාර්ග අංකයෙන් ද ,B ශ්‍රේණියේ මාර්ගය B අක්ෂරය සහ මාර්ග අංකයෙන් ද හූ ලක්ෂණ සිතියම්හි නිරූපණය වේ.


# අධිවේගී මාර්ග

E 01





අද්ධිවේගී මාර්ග ශ්‍රී ලංකා මාර්ග පද්ධතියට එකතු වුයේ මෑතක දී ය. හූ ලක්ෂණ සිතියම් හි එය දම් පැහැයෙන් දැක්වේ.

# දුම්රිය මාර්ග




දුම්රිය මාර්ගය කළු වර්ණයෙන් දක්වා ඇත. දුම්රිය පොළ සහ දුම්රිය නැවතුම රතු වර්ණයෙන් දක්වා ඇත.

# වැව් හා වාරි මාර්ග



භූ ලක්ෂණ සිතියමේ වැව නිල් පැහැයෙන් ද වැව් බැම්ම දුඹුරු පැහැයෙන් ද දක්වා ඇත.

වාරි ඇළ නිල් වර්ණයෙන් සංකේත වේ.

# පිළිතුරු සපයන්න

- ඔබ ඉගෙන ගත් භූ ලක්ෂණ හා සංස්කෘතික ලක්ෂණ වලට අදාළ සංකේත ඇඳ දක්වන්න.

- පෙළපොතේ 53 පිටුවේ දී ඇති මාතර සිතියමේ දිග හා පළල cm හා km වලින් දක්වා ඔබ කැමති කොටසක් වර්ණ සංකේත භාවිතයෙන් ඇඳ දක්වන්න.